# Abstract No 58

## කාලිදාසයන්ගේ ඍතුසංහාර කාව්‍යයෙන් ප්‍රතීත අද්භූත සෞන්දර්යවාදී (රොමෑන්ටික්වාදී) ලක්ෂණ

**මදාරා කරුණාරත්න**
ආධුනික කථිකාචාර්ය, , සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
madarakarunarathne86@gmail.com

දහ අටවන සියවස අගභාගයෙහි පමණ ප්‍රංශය, ජර්මනිය, බ්‍රිතාන්‍යය ප්‍රමුඛ කොටගත් බටහිර රටවල පැතිර ගිය විචාර සංකල්පයක් ලෙස අද්භූත සෞන්දර්යවාදය හැඳින්විය හැකි ය. අද්භූතවාදය යන්නට අමතර ව රොමෑන්ටික්වාදය, අරුමැසිවාදය, රොමාන්තිකවාදය හා අද්භූත සෞන්දර්යවාදය යනාදි පර්යාය නාම කිහිපයකින් හැඳින්වෙන මෙම විචාර සංකල්පය තත් රටවල පැවති සමාජ දේශපාලන පරිස්ථිතීන්ට අනුව නිර්මාණය වූවක් ලෙස ද සැලකිය හැකි ය. කාර්මීකරණයෙන් පසු ව යුරෝපයේ ඇති වන නව සමාජ විපරිණාමය අද්භූත සෞන්දර්යවාදී සාහිත්‍යයක් ඇති වීමෙහි ලා විශේෂයෙන් බලපෑවේය. පවතින අසුන්දර ලෝකයෙන් මිදී නව යහපත් සමාජයක් නිර්මාණය කළ හැක්කේ සෞන්දර්යවාදී ආස්ථානයක පිහිටා ලෝකය දැකීමෙන් පමණක් බව සෞන්දර්යවාදී නිර්මාණකරුවන්ගේ අදහස විය. ඒ අනුව විලියම් වර්ඩ්ස්වර්ත්, කෝල්රිජ්, පී.බී. ෂෙලී, කීට්ස් බඳු කිවිහු අද්භූත සෞන්දර්යවාදී සාහිත්‍යයක් නිර්මාණය කළ බටහිර කවීන් ලෙස පෙන්වා දිය හැකි ය. වර්තමානය වන විට බටහිර නිපන් සංකල්පයක් ලෙස අද්භූත සෞන්දර්යවාදය ප්‍රචලිත වුව ද කලාව විෂයෙහි සෞන්දර්යවාදය යන සංකල්පය පෙරදිග පහළ වන්නේ මීට දීර්ඝ කාලයකට පෙරය. ඒ සඳහා මූලාශ්‍රය කාව්‍ය කෘතියක් ලෙස කාලිදාසයන්ගේ ඍතුසංහාර කාව්‍යය අධ්‍යයනය කළ හැකි ය. මිනිසා හා සොබාදහම අතර පවත්නා අත්‍යන්ත සම්බන්ධය කාලිදාසයන්ගේ පූර්වෝක්ත කාව්‍යයෙහි මැනවින් ප්‍රකට කෙරේ. ගිම්හාන, වස්සාන , සරත්, හේමන්ත, සිසිර, වසන්ත ඍතු අළලා ගෙනෙන අපූර්ව සෞන්දර්ය වර්ණනා ඍතුසංහාර කාව්‍යයට පාදක වී ඇත. අද්භූත සෞන්දර්යවාදයෙහි මුඛ්‍ය ලක්ෂණයක් ලෙස සැලකිය හැකි සොබාදහමට සචේතනිකත්වය ආරෝපණය කිරීම මඟින් සොබා දහම හා මිනිසා අතර සම්බන්ධයක් නිර්මාණය කිරීම වැනි සෞන්දර්යවාදී ලක්ෂණ ඍතුසංහාර කාව්‍යයෙහි ද අධ්‍යයනය කළ හැකි ය. ඒ අනුව බටහිර රටවල අතිශය ජනප්‍රියත්වයට පත් විචාර සංකල්පයක් වූ අද්භූත සෞන්දර්යවාදයේ මූලික ලක්ෂණ කෙරෙහි සාවධාන වෙමින් කාලිදාස මහා කවියාගේ ඍතුසංහාර කාව්‍යයෙහි අද්භූත සෞන්දර්යවාදී කාව්‍ය ලක්ෂණ විද්‍යමාන වන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය මෙම පර්යේෂණයේ අරමුණයි. ඒ සඳහා කාලිදාසගේ ඍතුසංහාර කාව්‍යය මෙන් ම විලියම් වර්ඩ්ස්වර්ත් වැනි බටහිර සෞන්දර්යවාදී නිර්මාණකරුවන්ගේ කාව්‍ය නිර්මාණ ද මූලාශ්‍රය වශයෙන් යොදා ගැනේ. දීර්ඝ ඉතිහාසයක් හිමි සංස්කෘත බඳු පෙරදිග සාහිත්‍ය මූලයන්හි ආභාසය බටහිර මතු වූ නව සාහිත්‍යික ප්‍රවණතා කෙරෙහි බලපෑ අන්දම එමඟින් නිරීක්ෂණය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** ඍතුසංහාරය,කාලිදාස,අද්භූත සෞන්දර්යවාදය,වර්ඩ්ස්වර්ත්, රොමෑන්ටික්වාදය